# Admission to full time training courses - 2023

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

## ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කරගැනීම - 2023 වර්ෂය

**2023 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. **(අ) වයස : 2023.07.31** වැනි දිනට අවුරුදු16 ත් 22 ත් අතර විය යුතුය.

**(ආ) අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස (සා/ පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම.

**හෝ**

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම.

**විශේෂ කුසලතා :**

විදුලි/ විද්‍යුත්/ යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරග වලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

(ඇ) සැ. යු. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ වසර 03 ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

2. **පාඨමාලා මාධ්‍යය**

මෙහි දැක්වෙන සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ. තවද සිංහල භාෂාවේ ප්‍රවීණත්වය මත මෝටර් කාර්මික ශිල්පය හැර අනෙකුත් පාඨමාලා හැදෑරීම පිණිස ද්විධ මාධ්‍ය ආධුනිකයින්ටද අවස්ථාව හිමිවේ. ඉහත (ආ) හි ලන්ඩන් සාමාන්‍ය පෙළ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්කරන්නන්ට සිංහල/ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා හැදෑරීමට හැකියාව තිබිය යුතුය.

3. **ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය**

අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

අ) පවත්වන මාධ්‍යය : සිංහල/ දෙමළ

ආ) විභාග මධ්‍යස්ථාන : කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ වවුනියාව (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කරඇති අයදුම්කරුවන්ගේ කැමැත්ත මත වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.)

**විභාගයට අදාළ විෂයයන්**

ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, ඉංග්‍රීසි භාෂා දැනුම සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම්කර සකස් කරනු ලැබේ.

4. **විභාග ගාස්තු :** විභාග ගාස්තු වශයෙන් රු. 1000/= ක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

**ගිණුම :** ගණකාධිකාරී, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක 681490 ඇතුළත්වීම් විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. **මූලික තෝරා ගැනීම**

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

6. **අවසන් තෝරා ගැනීම**

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබාදෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා 60% ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

7. **පුහුණු පාඨමාලා**

| අනු අංකය | පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|
| 01 | මෝටර් කාර්මික ශිල්පය | අවු. 04 |
| 02 | මිල්රයිට් වැද්දුම් ශිල්පය | අවු. 04 |
| 03 | වායුසමීකරණ/ශීතකරණ ශිල්පය | අවු. 03 1/2 |
| 04 | බල විදුලි ශිල්පය | අවු. 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පය | අවු. 03 1/2 |
| 06 | මෙකාට්‍රොනික් (කර්මාන්තගත) ශිල්පය | අවු. 03 1/2 |
| 07 | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | අවු. 03 |
| 08 | වාහන විදුලි ශිල්පය | අවු. 03 |
| 09 | පෑස්සුම් ශිල්පය | අවු. 03 |
| 10 | මෝටර් වාහන, බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය | අවු. 03 |

ඔබ විසින් පාඨමාලා තෝරා ගැනීමේදී ඔබගේ කැමැත්ත අනුව ප්‍රමුඛතා අනුපිළිවෙළට අංක 01 සිට 10 දක්වා අයදුම්පත්‍රයෙහි නිවැරදිව සටහන් කළ යුතුයි.

සැ.යු. - ඔබගේ කැමැත්ත අනුව ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන පාඨමාලාව හැදෑරීම සඳහා ඔබට අවස්ථාව ලබා දීමට සෑමවිටම කටයුතු කරනු ලබන අතර එක් එක් පාඨමාලාව සඳහා පවතින ඉල්ලුම අනුව එසේ අවස්ථාව ලබාදීමට නොහැකි විටදී ආයතනය විසින් ඔබට ලබාදෙන පාඨමාලාව සඳහා යොමු විය යුතුය.

මෙම පාඨමාලාවන්හි කාලසීමාවන් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් එය සිදු කිරීමේ අභිමතය ආයතනය සතුවේ.

8. **ගිවිසුම් අත්සන් කිරීම**

ආයතනයේ පුහුණුවට තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු. 04, 03 1/2 සහ 03 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

9. **අයදුම්පත්**

ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර, අයදුම්පත්‍රය සමඟ **පහත දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවීම අනිවාර්ය වේ. ඡායා පිටපත් හා විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

අ) උප්පැන්න සහතිකය

ආ) අධ්‍යාපන සහතික

ඇ) ඉහත අංක 1හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ ජාතික මට්ටමේ සහතිකය

අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම – 2023" යනුවෙන් සඳහන් කළ යුතුය.**

**අයදුම්පත් ලබාගැනීම**

- අයදුම්පත් **www.cgtti.lk** දරන ආයතනීය වෙබ් අඩවියෙන්
- ආයතනයට පැමිණීමෙන්

2023.09.01 දිනැති රජයේ ගැසට් පත්‍රයේද ආදර්ශ අයදුම්පත පළකර ඇත.

10. **අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය**

අයදුම්පත් 2023.09.30 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ, කළමනාකාර - පරිපාලන හා මානව සම්පත් වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

11. **විභාග ප්‍රවේශපත්‍ර**

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර 2023.12.04 දින වන විට ලැබීමට සලස්වන අතර, ඒ වන විටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 07 ක් ඇතුළත පහත දුරකථන අංකයෙන් විමසිය යුතුය.

**කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය**
**582, ගාලු පාර, ගල්කිස්ස.**
**(අඟුලාන හන්දිය අසල)**

**දුරකථන අංකය : 0112 605 625**